දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாயா'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ..................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/26/07/01/01

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව

දිනය / திகதி / Date } 2008-04-04

චක්‍රලේඛ අංක - 2008/ 14

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යක්ෂවරුන්
සියලුම පළාත් හා කලාප ගණකාධිකාරිවරුන්
සියලුම විදුහල්පතිවරුන්

**<u>පාසල් පරිගණක විද්‍යාගාරවල පරිගණක ආශ්‍රිත දෘඩාංග ගැටලු විසඳා ගැනීම.</u>**

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල් පරිගණක විද්‍යාගාරවල පරිගණක ආශ්‍රිත ව සිදුවන දෘඩාංග ගැටලු විසඳීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ආරම්භ කර ඇති අතර මෙම වැඩපිළිවෙල ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට අවශ්‍ය පියවර සකස් වෙමින් පවතී.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී දෝෂ සහිත පරිගණක අලුත්වැඩියා කිරීම සඳහා මෙන්ම පවතින පරිගණකවල තත්වයන් ඉහළ නැංවීමට අදාළ විවිධ කොටස් මිල දී ගැනීමට සිදුවනු ඇත. අධ්‍යාපන ලේකම්ගේ අංක ED/3/37/12/16 දරණ හා 2006-03-21 දින නිකුත් කර ඇති අංක 2006/16 චක්‍රලේඛයට අනුව අධ්‍යාපන ගුණාත්මක ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා වාර්ෂික ව පාසල්වලට වෙන්වන මුදල් මේ සඳහා යොදා ගැනීමට ඉඩකඩ ඇත. ඒ අනුව මෙම යෝජිත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී දෝෂ සහිත පරිගණක අලුත්වැඩියා කිරීම සහ තිබෙන පරිගණකවල තත්වයන් ඉහළ නැංවීම සඳහා විවිධ උපාංග හා උපකරණ (Tools) මිලදී ගැනීම පිණිස ප්‍රාග්ධන භාණ්ඩ නඩත්තුව හා අලුත්වැඩියා කිරීම් යටතේ වෙන් වන ප්‍රතිපාදන මෙන්ම ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම සඳහා වෙන් වන ප්‍රතිපාදන යන ක්‍රම දෙකම භාවිත කළ හැකි බව දැනුම් දෙමි.

එමෙන්ම මෙම කාර්යය සඳහා වියදම් දැරීමේදීත් පාසල්වල දැනට ගුණාත්මක යෙදවුම් මිලට ගැනීම සඳහා ඉහත චක්‍රලේඛයෙහි සඳහන් විධි විධානවලට අනුව සිදුවිය යුතු බව තවදුරටත් දන්වමි.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය